# ශ්‍රී ලංකාවේ හින්දු ආගමික හා සංස්කෘතික උත්සව පිළිබඳ අධ්‍යයනයක්

*ප්‍රේමරත්න, ඩී. ජී. දේවින්ද ප්‍රභාත් ශ්‍රී* [1]

ලොව සිටින සෑම ජාතියකටම පාහේ කථන හෝ ලිඛිත භාෂාවක් ඇත. එමෙන්ම එකී ජාතියටම අනන්‍ය වූ සංස්කෘතියක්ද ඇත. යම් ජාතියක අනන්‍යතාව එකී සංස්කෘතිය හා බැඳී පවතී. ආහාර-පාන, ඇඳුම්-පැලඳුම්, සිරිත්-විරිත් යන ප්‍රායෝගික ජීවිතයේ සියලු දේ සංස්කෘතිය හා බැඳී ඇත. මේ සියලු කාරණා හින්දු සංස්කෘතියටද පොදුය. හින්දු ජනයාගේ ආකල්ප හා ඇවතුම්-පැවතුම් මොනවට කියාපාන කැඩපතක් ලෙස හින්දු ආගමික හා සංස්කෘතික උත්සව හඳුන්වා දිය හැකිය. හින්දු ජනයාගේ ප්‍රායෝගික ජීවිතයේ සියලු දේ ආගම හා බද්ධව ඇත. ඔවුහු ස්වභාව සෞන්දර්යට මූලිකත්වය ලබා දෙමින් සියලු කටයුතු අරඹති. ආගමට හා ස්වභාව සෞන්දර්යට ප්‍රමුඛත්වය දෙමින් උත්සව සියල්ලද සැකසී ඇත. හින්දු ජනයාගේ සංස්කෘතිය මනාව විශද කරන උත්සව ලෙස **'තෛපොංගල්'**, **'මාට්ටුප් පොංගල්'**, **'දීපවාලී'** හා **'සිත්තිරෛප් පුත්තාණ්ඩු'** උත්සව දැක්විය හැකිය. **'තෛපොංගල්'** යනු දමිළ ජනතාව විසින් ඉතා ඈත අතීතයේ සිටම සමරනු ලබන ඉතා වැදගත් පාරම්පරික උත්සවයකි. දමිළ ජනතාව ස්වභාව ධර්මයේ ප්‍රමුඛස්ථානයක් හිමිවන සූර්යා වන්දනා කිරීමටත්, තමන්ගේ කෘෂිකාර්මික ජීවිතයට සූර්යාගෙන් සැපයෙන සේවාවට කෘතගුණ සලකනු පිණිසත් **'තෛපොංගල්'** උත්සවය සමරති. ගොවි ජනයාට කෘෂිකර්මාන්තයේදී මහත් සේවාවක් සපයන ගවයින්ට කෘතගුණ සැලකීම සඳහා **'මාට්ටුප්පොංගල්'** සමරනු ලැබේ. අඥානය නමැති අඳුරින් ඉවත් වී ආත්ම ඥානය නමැති ආලෝකය ලබාගැනීම සමරනුවස් **'දීපාවලී'** උත්සවය සමරනු ලබයි. හින්දු බැතිමත්හු ජ්‍යෝතිෂ්‍ය ශාස්ත්‍රයට මුල් තැන දෙමින් ඉතාමත් ඕනෑකමින් පිළිවෙත් රකිමින් **'සිත්තිරෛප් පුත්තාණ්ඩු'** උත්සවය සමරති. මෙම පර්යේෂණයේ අරමුණ නම් සාහිත්‍ය මූලාශ්‍රය පදනම් කරගෙන හින්දු ආගමික හා සංස්කෘතික උත්සව පිළිබඳව විධිමත් සමාජවිද්‍යා අධ්‍යනයක් සිදුකිරීමයි.

ප්‍රමුඛ පදඃ ජාතිය, සංස්කෘතිය, හින්දු ජනයා, ආගමික උත්සව

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*devindaprabhathsri@gmail.com*